
# හැංගුණු චූටියා



ආර්.එම්.එස්. සන්තුලි බණ්ඩාර රන්දුනුගේ

කෘතියේ නම : හැංඟුණු චූටියා

කතෘ : ආර්.එම්.එස්. සන්තුලි බණ්ඩාර රන්දුනුගේ

ප්‍රකාශිත දිනය : 2025 පෙබරවාරි 08

චිත්‍ර නිර්මාණය : සන්තුලි බණ්ඩාර රන්දුනුගේ

මුද්‍රණය : නෙත්වින් ප්‍රින්ටර්ස්,
ගැටඹේ.
081 2386908

ප්‍රකාශ කිරීම : කතෘ ප්‍රකාශකයකි

# පිදුම

තෙළිතුඩින් සිත්තම් මවමින්

මාගේ පුංචි මනස අවදි කරන්නට

නිරන්තරයෙන් මා ළඟ සිටිමින්

මා පෙළඹ වු සහ මා දිරිමත් කළ

මගේ ම ආදර අම්මාත්,

අප්පොච්චාත්,

මහමායා බිම් කෙතේ

ගරු විදුහල්පතිනියත්, ඇදුරු මඬුල්ලත්

මා දිරි ගැන්වු සියලුම

දෙනාමත් හදපිරි බැතියෙන් සිහිපත් කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වේ. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# හැඳින්වීම

ඓතිහාසික සෙංකඩගල පුරවරයේ දළදා සමිඳුන් ගේ අනුහස් ලබමින් මහනුවර නගරයේ වැජඹෙන මහ/මහාමායා බාලිකා විදුහලේ ආරම්භය සනිටුහන් කිරීමේ ස්මරණය වෙනුවෙන් මෙම ග්‍රන්ථය සම්පාදනය කළෙමි. විද්‍යාලය ආරම්භ කළ අත්තදස්සී හිමිගේ ගුණානුස්මරණය නිමිත්තෙන් මෙම ග්‍රන්ථය මා විසින් ම රචනා කරන ලද්දකි. මාගේ සිත් පහන් කර ගැනීම සඳහාත්, ගත් කතුවරයෙකු වීමේ දැඩි කැමැත්ත සඳහාත් මම මෙම ග්‍රන්ථය රචනා කරන්නට අදහස් කළෙමි. පුංචි ඔබත් කතාන්දර කියවා දැනුම ලබා ගැනීමට කැමැත්තක් දක්වන්නේ නම් මෙය කියවා සතුටු වෙමු.


ආර්.එම්. සන්තුලි බණ්ඩාර රන්දුනුගේ

4 ශ්‍රේණිය A

මහ/මහාමායා බාලිකා විදුහල

# පටුන

1 වන පරිච්ඡේදය

**පුංචි චූටියා නිවසේ සතුටින් සිටීම** 01

2 වන පරිච්ඡේදය

**චූටියා හොරෙන් පැන යාම** 03

3 වන පරිච්ඡේදය

**සතුන් බිය වැද්දීම** 05

4 වන පරිච්ඡේදය

**උකුස්සාට හසු වීම** 07

5 වන පරිච්ඡේදය

**උකුස්සාගෙන් බේරා ගැනීම** 09

6 වන පරිච්ඡේදය

**බල්ලා පූසාව ඇල්ලීම** 13

# පුංචි චූටියා නිවසේ සතුටින් සිටීම

මගේ ගෙදර පුංචි පූස් පවුලක් හිටියා. පූස් අම්මයි, තාත්තයි, පුංචි පූස් චූටියයි. පුංචි පූස් චූටියා හරිම දඟකාරයි, අම්මයි, තාත්තයි කියන දෙයක් තියා අපි කියන දෙයක්වත් එයා ගානකට ගත්තේ නෑ.



# චූටියා හොරෙන් පැන යෑම

දවසක් මේ පුංචි පූස් චූටියා අපි හැමෝට ම හොරෙන් අපි ගෙදර නැති වෙලාවක ගෙදරින් ගිහින්. මම පාසල් ඇරී ගෙදර එන විටත් පුංචි චූටියා ගෙදර හිටියේ නෑ.

එයාගේ අම්මා මා ළඟට ඇවිත් "පුරු... පුරු," ගා මොනවදෝ කීවා. එහාට ගියා, මෙහාට ගියා. මට හිතුනා එයාගේ පූස් චූටියා නැති දුක මට කියනවා කියලා.

මමත්, අම්මත් හැම තැනම පූස් චූටියා හෙව්වා. ඒත් එයා ගෙදර ආවේ නෑ.



# සතුන් බිය වැද්දීම

පුංචි හිතුවක්කාර පුංචි චූටියා වත්ත මුදුනේ බව සත්තු හඬ නඟා කෑ ගහන ශබ්දෙන් අම්මා දැන ගත්තා.

හිතුවක්කාර පුංචි චූටියා වත්ත මුදුනට ගිහින් හැම සතෙක් ම බය කළා. බයවෙලා කෑ ගහන පැටවු දිහා බලලා හරිම සතුටෙන් හිනාවෙවී උඩ පැන්නා.

"ඤාවි... ඤාවි... ඤාවි..."



# උකුස්සාට හසුවීම

අම්මත්, මාත් වත්ත මුදුනට යන්න හදනකොට ම එකවර ම පුංචි චූටියා මහ හයියෙන් කෑගහන හඬක් ඇහුණා. අපි දෙන්නා පය ඉක්මන් කරලා චූටියාගේ හඬ ආ පැත්තට දුවගෙන ගියා

"අම්මේ... අම්මේ... අන්න චූටියා..." එතනින් ගිය උකුස්සෙක් චූටියව අල්ල ගෙන. චූටියා හොඳට ම



# උකුස්සාගෙන බේරා ගැනීම

"ෂු... ෂු... ෂු..." අම්මා කෑ ගසමින් අත්පුඩි ගැහුවා.

උකුස්සා චූටියව අතහැරලා ඈතට පියඹා ගියා. මම චූටියා ළඟට ගිහින් චූටියව වඩා ගත්තා. චූටියා සමාව ඉල්ලන්නාක් මෙන් බෑගෑපත්ව මා දෙස බැලුවා. අනෙක් කුරුළු පැටව්, ලේන් පැටවුන් ද මගේ චූටියා දිහා අනුකම්පාවෙන් බැලුවා. ඒගොල්ලන්ගෙත් මුහුණ බලමින් චූටියා ආයේ ඔයාලා මම කවදාවත් බය කරන්නේ නෑ කියලා වගේ, "ඎාව්... ඎාව්..." කිව්වා. එදා ඉඳලා කවදාවත් චූටියා අපිත් එක්ක හැංගිමුත්තන් කරන්න ගියේ නැහැ.



ජේනවා නේද? යාළුවනේ තවත් කෙනෙකුට හිරිහැර කරන්න ගියොත් තමන්ටත් කරදර වලට මුහුණ දෙන්න සිද්ධ වන හැටි, අපි ඒක හොඳට හිතට අරගෙන අපි අපිට ම පිහිට වෙන්න ඕනැනේද? කියලා පුංචි චූටියාගේ හිස අතගාමින් මම චූටියාට කිව්වා.



# බල්ලා පූසාව ඇල්ලීම

එදා ඉරිදා දිනයක්, මම අම්මත් එක්ක දහම් පාසල් ගොස් ගෙදර පැමිණ විගසම චූටියා සෙව්වෙමි.

"චූටී... චූටී... කෝ මගේ චූටියා...?"

"අම්මේ... අම්මේ..." මම එහෙට දිව්වෙමි, මෙහෙට දිව්වෙමි. චූටියා සොයාගත නොහැකි විය.

"අනේ අම්මේ මගේ චූටියා අදත් කොහෙ ද ගිහින්, අනේ අම්මේ හොයල දෙන්නකෝ..." මම පෙරැත්ත කරන්නට විමි.

අම්මාත් මා සමඟ චූටියා හොයන්නට විය. වත්ත පහළ, ගේ වට කිසිම තැනක චූටියා හොයාගත නොහැකි විය. මගේ ඇස් වලින් නොනවත්වා ම කඳුළු ගලන්නට පටන් ගත්තේ වර්ෂාවක් මෙනි.

"ඔයා අඬන්න එපා පුතේ, අපි චූටියා හොයා ගමු." අම්මා කීවාය.

එකවරම මට හඬක් ඇසුණි. "අක්කි බබා...! අක්කි බබා...!" මම දුවගෙන මිදුලට ගියෙමි.

"ඇයි නංගි බබා?" මම අසල්වැසි නංගිගෙන් විමසුවා ය.

"ඔයාගේ චූටි පූස් බබා කමනි නැන්දාගේ බල්ලා අල්ලලා. එයා මැරිලා..." නංගි බබා කීවා ය.

"අනේ මගේ චූටි පූස් බබා අම්මේ..." මට මහ හඬින් හැඬුණි. අම්මා මා වඩාගත්තාය. මුහුණ ඉඹ මා සනසමින් අපි ආයේ පූස් පැටියෙක් ගේමු යැයි කීවාය.

අනේ මගේ චූටියා හැංඟිලා ම ගිහින් මට සිතුණි.

- නිමි -



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්

# කතු වදන

# "හැංගුණු චූටියා"



**ආර්.එම්.එස්. සන්තුලි බණ්ඩාර රන්දුනුගේ**

මෙම කෘතියේ කියැවෙන්නේ සත්ත්ව ලෝකයේ අපි ආදරය කරන, ආදරය ලබන පුංචි සුරතල් පූස් පැටියෙක් වටා ගෙතුණු පුංචි තකාවක් පිළිබඳවයි. මිනිසුන්ට පමණක් නොවේ මේ පරිසර පද්ධතිය තුළ සෑම අයෙකුටම ජීවත් වීමේ සමාන අයිතියක් තියෙන බවත් හොඳින් පැහැදිලියි. එමෙන්ම කිසිම සතෙක් තවත් සතෙකුගෙන් හිරිහැර විඳින්න කැමති නැහැ. ජීවත්වීමට අපි හැමෝටම ආදරය, කරුණාව සහ නිදහස අවශ්‍යයි.

9 786242 082011

ISBN - 978-624-208-201-1